

# හද රිදවන මතක සුවඳ 4

රෝහිත මුණසිංහ
*ප්‍රංශයේ සිට*

රෝහණ විජේවීර සහෝදරයාගේ බිරිඳ වූ චිත්‍රාංගිනී විජේවීර ඔහුගේ බිරිඳව සිටිමින් සිය සැමියාටත් දරුවන්ටත් යුතුකම් ඉෂ්ට කළ හොඳ බිරිඳක මිස ජ.වි. පෙරමුණේ ගමන් මගට අවතීර්ණ නෙවූ එයට කිසිම අයුරකින් බලපෑමක් නොකළ තැනැත්තියක බව මා පෙරදී සඳහන් කළෙමි. එය එසේ වූවාවට ජ.වි.පෙ. ගමන් මගට බලපෑම කරන ලද කාන්තාවෝ කිහිප දෙනෙකුම සිටිති. එයින් තිදෙනෙකු ගැන කෙටියෙන් හෝ ලියන්නට පෙර, මා මෙන්ම ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් ආදරය කළ රෝහණ විජේවීර නම් වූ නායකයා ඝාතනයට ලක් වූ පසුව නාවික හමුදාව භාරයේ එම කඳවුරු නිවස්නයක රැඳී සිටි ඔහුගේ බිරිඳටත්, දරුවන්ටත් වර්තමානයේ සිදුව ඇත්තේ කුමක්දැයි විමසිය යුත්තකි. අවසන් වරට මට ඔවුන් ගැන දැන ගන්නට ලැබුණේ එම දරුවන් සියලු දෙනාම උපන් හපන්කම් ඇති ඉතාම දක්ෂනම් ඇති දරුවන් ලෙස ඉගෙනීමේ කටයුතු කරගෙන යන බවකි. එහෙත් මෙකල ඔවුන් ගැන කිසිඳු තොරතුරක්, කිසිඳු පුවත්පතකින් දැකගන්නට නැත. මින් වසර කිහිපයකට පෙර 'හිරු' පුවත්පත පළවූ කාලයේ 'ඊෂා විජේවීර' දියණිය සිය පියාණන් ගැන පබඳන ලද දුක්බර පැදි පෙළක් එහි පළව තිබෙනු දුටිමි. පසුව මට දැන ගන්නට ලැබුණේ දිගින් දිගටම හමුදා කඳවුරක රැඳී සිටීමට සිදුවීම නිසා ඊෂා දියණිය මානසික පීඩනයකට පත්ව සිටිය බවය. ඊෂා දැන් වයස අවුරුදු 25ක තරම් තරුණියකව සිටිය යුතු ය.

ජනතා විමුක්ති පෙරමුණේ ඉතිහාස කතාව හා විජේවීර, ගමනායක ආදී සහෝදරවරුන්ගෙ

**අවසානයේදී ඇය විමුක්ති ගී කණ්ඩායමෙන් ඉවත් කෙරිණි. මෙය තමාට රිදවීම සඳහා කළ දෙයක් යැයි වටහාගත් කෙලී බලවත් සේ කුපිත විය. අවසානයේදී ඔහු පක්ෂය හැරදමා යාමට සූදානම් විය. පක්ෂය කලේ ඊට පෙර ඔහු ඉවත් කිරීම ය. ජ.වි.පෙ. ට විරුද්ධව යමක් ලීවිමට කෙළ හලාගෙන බලා සිටින ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ 'ඇත්ත' පත්තරයට මෙම ඉතා හොඳ ප්‍රවෘත්තියක් විය. ඇත්ත පත්තරය මේ සිද්ධිය මුල් පිටුවේ ප්‍රධාන පුවතින්ම වාර්තා කළේ 'කෙලීටත් කෙලී' යනුවෙනී.**

' ජීවිත කතාව මතු මතුත් උපදින පරම්පරා විසින් දැනගත යුත්තකි. හැදෑරිය යුත්තකි. 1983 පක්ෂය තහනම් කිරීමෙන් පසු මේ නායකයන් රජයේ ආරක්ෂක අංශවල ඇස්වලට වැලිගසමින් අප්‍රසිද්ධියේ ගතකරන ලද ජීවිතයේ බොහෝ අප්‍රකට තොරතුරු දන්නේ බිරින්දෑවරුන්ය. ඔවුන් මුහුණදුන් එම දුෂ්කර හා ත්‍රාසජනක ජීවිතයේ අනුවේදනීය තතු ලිඛිත ඉතිහාසයක් ලෙස අනාගත පරපුර වෙනුවෙන් සටහන් කර තබන්නේ නම්, නැතහොත් සටහන් කර තැබිය හැකි කිසිවෙකුට හෙළිදරව් නොකරන්නේ නම් එය මහා අපරාධයකැයි මට සිතේ. මට පණිවුඩයක් යවාගත හැකි දුරක සිටින 'කරුණා ගමනායක' සොයුරියට එම යෝජනාව කළ යුතු යැයි මා සිතා ගත්තේ මේ සටහන ලියන අතරම ය.

ජ.වි.පෙ. අධ්‍යාපන පංති වැඩ සටහන හෙවත් අධ්‍යාපන කඳවුරු පවත්වන විටදී 'පක්ෂ ඉතිහාසය' නම් පන්තියක් ද ඊට ඇතුළත්

**......අහම්බෙන් මෙම වතුර බේසම වෙත පියඹා ආ පොල් කිච්චෙකු එයින් දිය බිව්වේය. ඉන් මොහොතකට පසු පොල් කිච්චා එතනම මැරී වැටුණි. මෙම සිද්ධිය නොදුටු රෝහණ සහෝදරයා වතුර බේසම කරා පා නැගීය. බේසමින් වතුර බිව් පොල් කිච්චා බිම ඇද වැටෙනු දුටු වෙනත් සහෝදරයෙකු වහා දුවගොස් වතුර බේසම පෙරළා දැමී ය.**

වෙයි. මේ නිල පංතියේ සාකච්ඡා කෙරෙන ඉතිහාසය සිදුවීම්වලට අමතරව නොනිල මට්ටමේ ඉතිහාස කරුණු හා සිදුවීම් ද අප අතර සාකච්ඡා වෙයි. මෙය පක්ෂයේ අභ්‍යන්තර ඕපාදූප වශයෙන් හැඳින්වූවාට වරදක් නොවේ. එම කරුණු සාකාච්ඡා කෙරෙන්නේ කමිටුවල සිටින අප අප අතර පමණය.

මා මෙම ලිපියේ මුලින් කී කාන්තාවන් තිදෙනාගෙන් එක් අයකු නම් 'වත්තල මොරීන්ය'. ඇහැට කණට පෙනෙන රූපයක් හා සමාජශීලී ගතිගුණ ඇති මොරීන් පක්ෂයේ විශ්වාසය දිනා ගත්තියකි. විවිධාකාරයෙන් පක්ෂයේ වැඩට සහභාගී වූ, සහයෝගය දැක් වූ මොරීන්ගේ නිවස පක්ෂ නාකයන්ගේ පණිවිඩ හුවමාරු වන, නායකයන් යන එන මධ්‍යස්ථානයක් බවට පත්ව තිබූ තැනකි. දේශපාලන මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීමටද එම නිවස ප්‍රයෝජනයට ගැණුනේ ය. මෙම අවධියේ දේශපාලන මණ්ඩලයේ රහස් කිහිපයක් පිටතට කාන්දු වූ නමුදු එම සිදුරු කොතැනක වී දැයි සොයාගත හැකි වූයේ තරමක් කල් ගත වූ පසුවය.

මොරීන්ගේ නිවසේදී මැදියම් රැය ද ඉක්මවා යනතෙක් දේශපාලන මණ්ඩලයේ රැස්වීමක් පැවැත්වූ එක්තරා දිනයක පක්ෂයේ නායකයන් එහිම නිදා ගත්හ. පසුදින උදෑසන එකිනෙකා පිබිදී මුහණ කට සෝදා ගන්නා අතර මොරීන් විසින් රෝහණ සහෝදරයාට මුහුණ සෝදා ගැනීම සඳහා වතුර බේසමක් සූදානම් කර තැබුවාය. එවිට ඔහු සිටියේ එහාටත් මෙහාටත් ඇවිදිමින් දත් මදිමිනි. අහම්බෙන් මෙම වතුර බේසම වෙත පියඹා ආ පොල් කිච්චෙකු එයින් දිය බිව්වේය. ඉන් මොහොතකට පසු පොල් කිච්චා එතනම මැරී වැටුණි. මෙම සිද්ධිය නොදුටු රෝහණ සහෝදරයා වතුර බේසම කරා පා නැගීය. බේසමින් වතුර බිව් පොල් කිච්චා බිම ඇද වැටෙනු දුටු වෙනත් සහෝදරයෙකු වහා දුවගොස් වතුර බේසම පෙරළා දැමී ය.

සිරගතව සිටියදී බොරු පිස්සුවක් ආරූඪ කරගත් දේව බණ්ඩාර සේනාරත්න යකඩ උලකින් ඇන රෝහණ සහෝදරයා මරා දැමීමට ගත් උත්සාහයක් ගැන ප්‍රසිද්ධ පුවතක් ඇතත් පොල් කිච්චා මැරී වැටුණ කථාන්දරය දැනගත හැකි වුයේ පක්ෂ අභ්‍යන්තරයේ තොරතුරු ලැබුණ සහෝදවරුන්ට පමණෙකි. මොරින්ගේ නිවස හා පක්ෂය අතර තිබු සියලු සබඳතාවන් නවත්වා දමන ලද්දේ මෙම සිද්ධියෙන් පසුවය. වත්තල මොරින් පක්ෂයේ රහස් දැන ගැනීමට, පක්ෂයේ නායකයන් බිලී බා ගැනීමට, රෝහණ සහෝදරයාට වසදී ඝාතනය කරන්නට හතුරන් විසින් යොදවන ලද ඔත්තු කාරියකැයි පක්ෂය විසින් පසුව නිගමනය කරන ලදී.

1978 දි කියුබානු සාමාජවාදී ජනතා රජයෙන් ලැබුණු ආරාධනයකට අනුව රෝහණ සහෝදරයා ප්‍රමුඛ ජ.වි.පෙ. නායක සහෝදවරුන් පිරිසක් 'හවානා ' බලා ගියේ එහි මුළුදුන් ජාත්‍යන්තර තරුණ සමුළුවක් නියෝජනය කිරීම පිණිසය. එවිට පක්ෂයේ හිතවතියකව සිටි 'සුනිලා අබේසේකර' ද මෙම පිරිසට ඇතුළත් විය. පක්ෂයේ ඉදිරියෙන් වැඩකළ වෙනත් සහෝදරියක් මෙම ගමනට එකතු කර නොගත්තේ මන්දැයි අප පක්ෂයෙන් විමසු කළ, 'මාර්ග' ආයතනයේ රැකියාව කල සුනිලාගේ ඉංග්‍රීසි දැනුම සැලකිල්ලට ගෙන ඇයට අවස්ථාවට දුන්බව දැන ගන්නට ලැබිණ.

කියුබාවේ සමුළුව අවසන් වී අනෙක් සහෝදරවරු ලංකාවට පැමිණි අතර රෝහණ සහෝදරයා එංගලන්තයට ගියේ එහි සිටි පක්ෂයේ හිතවතුන්ගේ ආරාධනයෙනි. රෝහණ සොයුරා විසින් ජ.වි.පෙ. පළමුවන විදේශිය ශාඛාව වන 'ලන්ඩන් ශාඛාව' පිහිටුවන්නේ මෙම ගමනේදී ය.

කියුබාවේ ගතකළ කාලයේදී පක්ෂයේ දේශපාලන මණ්ඩල සාමාජිකයෙකු වු 'කෙලී සේනානායකගේ' හා සුනිලා අබේසේකරගේ හැසිරීම සැක සහිත බැවින් කෙලීගෙන් ස්වයං විවේචනයක් ලබා ගන්නා ලෙස රෝහණ සහෝදරයා ලංකාවට දන්වා එවන ලද්දේ ලන්ඩනයේ සිටියදී මය. එවිට කෙලී පවසා තිබුනේ ඔවුන් දෙදෙනා අතර කිසිදු අනිසි සම්බන්ධතාවයක් නොමැති බවය.

එයින් මඳ කලකට පසු සුනිලා 'විමුක්ති ගී' කණ්ඩායමේ ගායිකාවක් බවට පත් වුවාය. මේ අතර කෙලී හා ඇය අතර සම්බන්ධයක් ඇති බවට පක්ෂයට ස්ථිර සාක්ෂි ලැබී තිබිණ. තත්ත්වය බරපතළ වුයේ දේශපාලන මණ්ඩල රහස් කිහිපයක් පිටවී තිබීමෙනි. සැකයට භාජන වුයේ කෙලී ය.

මේ අතරවාරයේදී විමුක්ති ගී කණ්ඩායම තුළ සුනිලාගේ හැසිරීම ප්‍රශ්ණකාරී විය. යම් අවස්ථාවන්වල ඇය සංවරව නොසිට පුද්ගලිකව කැපී පෙනීමට උත්සාහ දරන්නී යයි චෝදනා නැගීණ. අවසානයේදී ඇය විමුක්ති ගී කණ්ඩායමෙන් ඉවත් කෙරිණි. මෙය තමාට රිදවීම සඳහා කළ දෙයක් යැයි වටහාගත් කෙලී බලවත් සේ කුපිත විය. අවසානයේදී ඔහු පක්ෂය හැරදමා යාමට සුදානම් විය. පක්ෂය කලේ ඊට පෙර ඔහු ඉවත් කිරීම ය. ජ.වි. පෙ. ට විරුද්ධව යමක් ලීවිමට කෙළ හලාගෙන බලා සිටින ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ 'ඇත්ත' පත්තරයට මෙම ඉතා හොඳ ප්‍රවෘත්තියක් විය. ඇත්ත පත්තරය මේ සිද්ධිය මුල් පිටුවේ ප්‍රධාන පුවතින්ම වාර්තා කළේ 'කෙලීටත් කෙලී' යනුවෙනී.

එම සිද්ධිදාමය සිදු වී වසර 13කට පමණ පසු ප්‍රංශයේ පළ කෙරෙන ජ.වි.පෙ. ජාත්‍යන්තර අංශයේ පුවත්පත වු 'අරුණෝදය' 1993 අප්‍රේල් කලාපයේ යම්කිසි පුවතක් පළවෙන්නේ මෙසේය. " ජ.වි.පෙ. නායකයෙක් සිය වසඟයට ගත්තා වු ද, ඔහු සමඟ මානව අයිතීන් සුරැකීමේ සංවිධානයේ මුදල් සොරකම් කර අලුත් පාරක යන මුද්‍රණාලයක් ආරම්භ කළාවු ද, පිං සවාරිවලට කෑදරකමක් දක්වන්නා වුද, මානව අයිතීන් විකුණාගෙන කන්නා වුද, සම්භාවනීය ගනිකාවක් වුද, කාන්තා විමුක්ති නායිකාවක් එක් වී ජ.වි.පෙ.ට එරෙහිව ස්විට්සර්ලන්තයේදී කුමන්ත්‍රණය කළබව අරුණෝදයට දැන ගන්නට ලැබී ඇත.'

(ලබන කලාපයට)


